**1 · 23 සංඛ්‍යා සටහන**

**ආයෝජන ප්‍රවර්ධන කලාපය—සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම්**

| කර්මාන්ත | | 1982 (අ) | | 1983 (ආ) | |
|---|---|---|---|---|---|
| | | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට) ගණන | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු. දශ ලක්ෂ | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට) ගණන | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු. දශ ලක්ෂ |
| 1. | මසා නිමකළ ඇඳුම් සහ පාවහන් .. | 18,853 | 1,306·8 | 22,389 | 1,918·9 |
| 2. | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 1,094 | 89·9 | 760 | 107·6 |
| 3. | විද්‍යුත් හා විදුලි උපකරණ .. | 304 | 25·2 | 431 | 54·9 |
| 4. | වානේ හා සකස් කළ ලෝහ නිෂ්පාදිත සහ යන්ත්‍ර සූත්‍ර ප්‍රවාහන උපකරණ .. | 129 | 8·5 | 175 | 37·7 |
| 5. | ස්වර්ණාභරණ සහ මැණික් කැපීම .. | 587 | 15·0 | 684 | 18·0 |
| 6. | පාන වර්ග සහ දුම්කොළ .. | 13 | 10·4 | 30 | 41·7 |
| 7. | ද්‍රව නිෂ්පාදිත .. | 113 | 2·7 | 64 | 1·6 |
| 8. | ලෝහමය නොවන නිෂ්පාදිත .. | 72 | 4·7 | 85 | 5·6 |
| 9. | කොහු නිෂ්පාදත .. | 113 | 4·2 | 29 | 9·4 |
| 10. | අනෙකුත් .. | 1,328 | 185·7 | 1,406 | 224·1 |
| | එකතුව .. | 22,606 | 1,653·1 | 26,053 | 2,419·5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : මහ කොළඹ ආර්ථික කොමිසම.

## ආර්ථික හා සමාජ පොදු කාර්‍ය්‍ය පිරිවැය

### බලශක්තිය

ආර්ථික කටයුතු කඩිනම්වීමත්, ආර්ථික යටිතල පහසුකම් සඳහා ඒ අනුසාරයෙන් ඇතිවූ පුළුල් ඉල්ලුමත්, මෑත වර්ෂවලදී බලශක්ති පරිභෝජනයේ පෙර නොවූ විරූ වර්ධනයකට මගපෑදීය. ඉල්ලුම හා සැපයුම අතර වූ අසමතුලිත බව හා එහි ප්‍රතිඵලයක් වශයෙන් සැපයුම මත බලපෑ පීඩනය 1983 දී ද අඛණ්ඩව පැවතිණි. ජාත්‍යන්තර වශයෙන්, පසුගිය දස වසර මුළුල්ලේ මෙරට ගෙවුම් ශේෂය කෙරෙහි බලවත් දුෂ්කරතාවයන් ගෙන ආ ලෝක වෙළෙඳ පොලේ තෙල් මිළ, 1973 න් පසු ප්‍රථම වරට 1983 දී පහත වැටිණි. සැබවින්ම, 1983 දී, හුදෙක් මූර්ත වශයෙන් පමණක් නොව නාමික වශයෙන් ද තෙල් මිළ පහත වැටිණි. එහෙත් පෙර නොවූවිරූ අන්දමට නියඟයෙහි බලපෑමෙන් ජල විදුලිය බල උත්පාදනය තියුණු ලෙස සීමාවීම නිසා මෙම හිතකර ජාත්‍යන්තර වාතාවරණයෙන් සම්පූර්ණ වාසි ලබාගැනීමට ශ්‍රී ලංකාවට නොහැකි විය. මේ නිසා තාප බලාගාර ක්‍රියාත්මක කිරීම සඳහා ආනයනය කළ තෙල් (බැර ඩීසල්) වැඩි වශයෙන් පාවිච්චි කිරීමේ අවශ්‍යතාවය ඇති විය. වර්ෂය තුළදී ලැබුණු අඩු වර්ෂාපතනයේ ප්‍රතිඵලයක් වශයෙන් අඩු ජල මට්ටමක් පැවතීමේ හේතුවෙන්, අළුතින් එක්වූ කැනියොන් ව්‍යාපෘතිය (මෙගවොට් 30) මගින් ඇතිවූ අමතර ජල විදුලි බල ධාරිතාවය සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගැනීමට ද නොහැකි විය.

බලශක්ති පරිභෝජනය පහත හෙළීමේ පියවරක් වශයෙන් වසරේ අවසාන කාලයේදී දීප ව්‍යාප්තව විදුලිය බලය කපා හැරීම ක්‍රියාත්මක කළ අතර, ආර්ථික ක්‍රියාවලිය කෙරෙහි කෙටි කාලීන බලපෑමක් ඉන් ඇතිවිය. ඊට අමතරව බලශක්තිය සංරක්ෂණයේ ඵලදායී පියවරක් ලෙස ඛනිජ තෙල් මිළ හා විදුලිය බල ගාස්තු සංශෝධනය කිරීම කෙරෙහි ද බලධාරීහු යොමු වූහ.

මෙබඳු පසුබිමක් තිබියදීත්, 1973 දී ප්‍රථම වරට තෙල් මිළ ඉහළ නැගීමෙන් පසු දක්නට ලැබුණු මිළ වැඩිවීමේ උපනතියේ වෙනසක් සිදු කරමින්, 1983 වසරේදී තෙල් ආනයන වියදම විගැඹි මෙන්ම ශ්‍රී ලංකා රුපියල් වටිනාකම අනුව ද තියුණු ලෙස අඩු විය. තෙල් ආනයනය නිසා මෙරට ගෙවුම් ශේෂය මත පැටවුනු ඉහළ නැගෙමින් පැවති බර මේ මගින් ලිහිල් විනි. 1983 වර්ෂයේදී, රටේ වාණිජ බලශක්ති සැපයුමෙන් සියයට 66 කට දායක වූ ඛනිජ තෙල්, මුළු ආනයන වියදමෙන් සියයට 24 ක් උකහා ගත් අතර, 1982 දී එම ප්‍රමාණය සියයට 29 ක් විය. තෙල් ආනයන වියදම, ඛනිජ තෙල් නොවන අපනයනයන්ගේ වටිනාකමෙහි ප්‍රතිශතයක් ලෙස ගෙන බැලීමේ දී, 1982 දී පෙර නොවූ විරූ ලෙස සියයට 67 ක් වූ අතර මේ වර්ෂයේදී සියයට 49 දක්වා අඩුවීම නිසා මෙරට ගෙවුම් ශේෂය මත පැටවුනු බර ලිහිල් වීමක් ලෙස දැකිය හැකිය.

තෙල් ආනයන වියදම අඩුවීම, ප්‍රධාන වශයෙන් එහි ආනයන පරිමාවේ අඩුවීම සහ ජාත්‍යන්තර වෙළෙඳපොලේ මිළ ගණන් අඩුවීමේත් ප්‍රතිඵලයක් විය. මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.2 ක් වූ 1982 ආනයන පරිමාව, 1983 දී මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2 දක්වා අඩුවිය. බොර තෙල් මිළ සියයට 11 කින් ද, පිරිපහදු නිෂ්පාදනවල මිළ සියයට 18 කින් ද අඩු විය. ඉකුත් වසර හා සසඳන විට මේ වර්ෂයේදී ඛනිජ තෙල් නිෂ්පාදන අපනයනයෙන් ඉපැයූ ආදායම විගැඹි අනුව සියයට 24 කින් පහත වැටිණි. අපනයනය කළ හැකි ඛනිජ තෙල් නිෂ්පාදිතවල නිෂ්පාදන ප්‍රමාණය අඩුවීම ඛනිජ තෙල් අපනයන ආදායම පහත වැටීමට ඉවහල් වන්නට ඇත. නඩත්තු කටයුතු සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (ලං.ඛ.නී.සං.) තෙල් පිරිපහදුව 1983 වසරේ මුල් භාගයේදී සති අටක පමණ කාලයක් වසා තැබීම නිසා මේ වර්ෂය තුළදී ආනයනය කළ පිරිපහදු නිෂ්පාදන ප්‍රමාණය සීඝ්‍ර ලෙස වැඩිවූ අතර, එය ඉකුත් වසරේ ප්‍රමාණයට වඩා සියයට 80 කින් ඉහළ ප්‍රමාණයක් විය.

මූලික වශයෙන් එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය පිරිහීම නිසා ඉහළ ගිය රුපියල් වියදම පියවීම සඳහාත්, ඛනිජ තෙල් නිෂ්පාදනයන්ගේ පරිභෝජනය යථාරූපී කිරීමේ මගක් වශයෙනුත් සළකා, ලං.ඛ.නී.සං. විසින් 1983 වර්ෂයේදී දෙවරක්ම ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනයන්ගේ දේශීය අලෙවි මිළ ගණන් වැඩි කරනු ලැබීය. කෙසේ වෙතත්, අඩු ආදායම් ලබන කොටස්වල ඉන්ධන වියදමට සහනාධාරයක් වශයෙන් ඇති කළ භූමිතෙල් මුද්දර ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක විය. භූමිතෙල් සහනාධාරය නිසා ලං.ඛ.නී.සං. ට දැරීමට සිදුවූ රුපියල් දශ ලක්ෂ 141 ක් වූ පාඩුව භාණ්ඩාගාරය මගින් පියවන ලදී. මීට පෙර කිසිම දිනක නොවූ පරිදි 1983 දී නියම පිරිවැයට වඩාත් ලංවන සේ මිළ ගණන් ගෙන ඒමත් සමග භූමිතෙල් පරිභෝජනය අඩුවීම (සියයට 9 කින්) තුළින් බලශක්ති සංරක්ෂණය පිළිබඳ කැපී පෙනෙන උපනතියක් දැකිය හැකි විය. සියයට 10 ත් සියයට 40 ත් අතර ප්‍රමාණයන්ගෙන් මිළ ගණන් වැඩි කර තිබියදීත් අනෙකුත් ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතයන්ගේ පරිභෝජනය 1982 පැවති මට්ටමට වඩා වැඩි විය. විදුලිය බල උත්පාදනයෙහිලා ඛනිජ තෙල් මත ක්‍රමයෙන් වැඩිවන රඳා පැවැත්ම පිළිබිඹු කරමින්, 1983 දී බැර ඩීසල් පරිභෝජනය ඉකුත් වසරේ ප්‍රමාණය මෙන් දෙගුණයකින් වැඩි විය. මෙට්‍රික් ටොන් 2,85,506 ක් වූ මේ වසරේ මුළු බැර ඩීසල් පරිභෝජනයෙන් සියයට 88 ක් ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) මගින් ප්‍රයෝජනයට ගන්නා ලදී.

මෙගවොට් 30 ක ධාරිතාවයකින් යුත් කැනියොන් ජලවිදුලි බලාගාරය 1983 මාර්තු මාසයේ සිට සේවාව සඳහා යොදා ගැනීමත් සමග ලං.වි.ම.යේ ස්ථාපිත ධාරිතාව මෙගවොට් 592.25 ක් බවට පත් විය. මෙම ධාරිතාවයෙන් මෙගවොට් 190 ක් තාප බලය විය. මේ වසරේ ප්‍රථම මාස අට තුළ ජලාශ ආශ්‍රිත ප්‍රදේශවල පැවති අයහපත් කාලගුණ තත්ත්වය නිසා ජල විදුලිය බල සැපයුම සියයට 24 කින් අඩු විය. ජල බල සැපයුම අඩු වෙමින් තිබියදීත් බලශක්තිය සඳහා වර්ධනය වෙමින් පැවති ඉල්ලුම සැපිරීමවස් ලං.වි.ම. තාප බල උත්පාදනයේ පිහිට වැඩි වශයෙන් ලබා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේ වසරේදී තාප බල සැපයුම සියයට 96 කින්

වැඩි විය. මෙම කාලච්ඡේදය තුළදී උත්පාදන ධාරිතාවයේ තුලනයක් පවත්වා ගැනීම සඳහා ජලාශයන්හි ඇති ජල ප්‍රමාණය පිරිමැස්මෙන් යුතුව ප්‍රයෝජනයට ගැනීමට උත්සාහ ගන්නා ලදී. විදුලිය බල උත්පාදනය සඳහා ඛනිජ තෙල් ප්‍රයෝජනයට ගැනීම ලං.වි.ම. ට මෙන්ම පාරිභෝගිකයාට ද අධික වියදම් දනවන විකල්පයක් විය.

**1 . 24 සංඛ්‍යා සටහන**

**බලශක්ති අංශයේ මූලික ලක්ෂණ 1982—1983**

| ශීර්ෂය | 1982 | 1981 ට වඩා ප්‍රතිශත වෙනස | 1983 | 1982 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1· ඛනිජ තෙල් නිෂ්පාදන | | | | |
| 1·1 අපනයන (රුපියල් දශ ලක්ෂ) .. | 3,220·3 | — 4·9 | 2,681·9 | — 16·7 |
| 1·2 ආනයන (රුපියල් දශ ලක්ෂ) .. | 12,222·3 | 23·4 | 11,023·7 | — 9·8 |
| 1·3 ආනයනය කළ ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | | | | |
| 1·3·1 බොර තෙල් .. | 1,940,542 | 13·4 | 1,491,973 | — 23·1 |
| 1·3·2 පිරිපහදු නිෂ්පාදන .. | 270,302 | 72·8 | 487,593 | 80·4 |
| 1·4 බොර තෙල්වල සාමාන්‍ය මිල (බැරලයක් රුපියල්) .. | 715 | 3·6 | 714 | — 0·1 |
| 1·5 දේශීය මිල (ලීටරයක් රුපියල්) | | | | |
| 1·5·1 පෙට්‍රල් .. | 10·00 | — | 13·50 | 35·0 |
| 1·5·2 භූමිතෙල් .. | 3·89 | — | 6·58 | 69·1 |
| 1·5·3 සුදු ඩීසල් .. | 5·94 | — | 8·13 | 36·9 |
| 1·5·4 බැර ඩීසල් .. | 5·68 | — | 7·83 | 37·8 |
| 1·5·5 සුපිරි ඩීසල් .. | 6·60 | — | 9·28 | 40·6 |
| 1·5·6 දැවි තෙල් — 500 .. | 4·44 | — | 4·89 | 10·1 |
| 800 .. | 4·40 | — | 4·84 | 10·0 |
| 1000 .. | 4·29 | — | 4·72 | 10·0 |
| 1·5·7 තාර .. | 6·27 | — | 6·95 | 10·8 |
| 1·6 දේශීය අලෙවිය (මෙට්‍රික් ටොන්) | | | | |
| 1·6·1 පෙට්‍රල් .. | 114,233 | 4·8 | 117,477* | 2·8 |
| 1·6·2 භූමිතෙල් .. | 174,108 | 3·5 | 159,149* | — 8·6 |
| 1·6·3 සුදු ඩීසල් .. | 457,838 | 8·3 | 465,925* | 1·8 |
| 1·6·4 බැර ඩීසල් .. | 143,124 | 34·2 | 285,506* | 99·4 |
| 1·6·5 සුපිරි ඩීසල් .. | 8,364 | — | 10,411* | 24·4 |
| 1·6·6 දැවි තෙල් .. | 273,573 | 2·9 | 279,979* | 2·3 |
| 2· විදුලිය බලය | | | | |
| 2·1 ස්ථාපිත ධාරිතාවය (මෙගවොට්) .. | 562·25 | 7·7 | 592·25 | 5·3 |
| 2·1·1 ජල බලය .. | 372·25 | — | 402·25 | 8·1 |
| 2·1·2 තාප බලය .. | 190·00 | 26·7 | 190·00 | — |
| 2·2 ජනනය කළ ඒකක (කි.වො.පැ. දශ ලක්ෂ) .. | 2,065·7 | 10·4 | 2,114·4 | 2·4 |
| 2·2·1 ජල බලය .. | 1,608·1 | 2·3 | 1,217·2 | — 24·3 |
| 2·2·2 තාප බලය .. | 457·6 | 52·4 | 897·2 | 96·1 |
| 2·3 මුළු අලෙවිය (කි.වො.පැ. දශ ලක්ෂ) | 1,686·1 | 12·2 | 1,790·6 | 6·2 |
| 2·3·1 ගෘහස්ථ .. | 258·3 | 19·3 | 304·8 | 18·0 |
| 2·3·2 කාර්මික .. | 739·2 | 9·1 | 752·0 | 1·7 |
| 2·3·3 වාණිජ .. | 262·5 | 19·4 | 291·8 | 11·2 |
| 2·3·4 පළාත් පාලන ආයතන .. | 417·5 | 9·7 | 433·0 | 3·7 |
| 2·3·5 වීථි ආලෝක කිරීම .. | 8·6 | 1·2 | 9·0 | 4·6 |

1. වර්ෂය අවසානයට.
* තාවකාලිකය.

මූලයන් : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ; ලංකා විදුලිබල මණ්ඩලය.

1983 වසරේදී ලං.වි.ම. විසින් උත්පාදිත මුළු විදුලිය බල ප්‍රමාණය කිලෝ වොට් පැය දශ ලක්ෂ 2,114 ක් වූ අතර, එය ඉකුත් වසරට වඩා සියයට 2 කින් වැඩි ප්‍රමාණයක් විය. ඉකුත් වසර හා සසඳන විට මේ වසරේදී ජල විදුලිය බල උත්පාදනය සියයට 24 කින් අඩුවූ අතර, තාප බල උත්පාදනය සියයට 96 කින් වැඩි විය. මුළු බල උත්පාදනයෙන් ජල විදුලිය බලයේ කොටස සියයට 58 ක් වූ අතර, ඉතිරි සියයට 42 තාප බලාගාරයන්ගෙන් ලැබිණි. 1982 වසරේ මීට අදාළ සංඛ්‍යාවන් වනුයේ පිළිවෙලින් සියයට 78 ක් සහ සියයට 22 කි. විදුලිය බලය උත්පාදනය සඳහා වැඩි වැඩියෙන් ඛනිජ තෙල් යොදා ගැනීමට සිදුවීම නිසා, 1983 අගෝස්තු මාසයේ සිට බලපැවැත්වෙන පරිදි ඉන්ධන ගැලපුම් ගාස්තුව සියයට 110 සිට සියයට 185 දක්වා වැඩි කිරීමට ලං.වි.ම.ට සිදු විය. තවද බලාගාර ආශ්‍රිත ජලාශයන්හි ජල මට්ටම රැකගැනීමේ අරමුණින් 1983 අවසන් කාලයේදී දිනකට පැය දෙකක් තුළ දිවයින පුරා විදුලිය බලය කපා හැරීම ලං.වි.ම. විසින් ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත්, 1982 හා සසඳන විට මේ වර්ෂයේදී මුළු විදුලිය බල අලෙවිය සියයට 6 කින් ඉහළ නැගිණි.

**ගමනාගමනය**

1983 වර්ෂයේ ගමනාගමන අංශයේ දක්නට ලැබුණු සැළකිය යුතු විශේෂ ලක්ෂණය වූයේ, මගී සහ භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් පෞද්ගලික අංශය පෙන්වූ ක්‍රමික ප්‍රගතියයි. 1979 න් පසු මගී ප්‍රවාහනයෙහිලා පෞද්ගලික අංශයේ සහභාගිත්වය සැළකිය යුතු ලෙස පුළුල් වීම කෙරෙහි බලපෑ විශේෂ සාධකයන් වූයේ අඩු ආනයන තීරු බදු සහ එක්වර ක්ෂය කිරීමේ පහසුකම් ලබා දීමය. කෙසේ වෙතත්, 1983 අප්‍රේල් 1 වැනි දින සිට එක්වර ක්ෂය කිරීමේ පහසුකම් ඉවත් කරනු ලැබිණි.

UNIVERSITY OF MORATUWA
LIBRARY
SRI LANKA

විමසුමට ලක්වන වසර තුළදී ද රාජ්‍ය අංශය මගී ප්‍රවාහන සේවාවන්ගෙන් සියයට 75 ක් පමණ දායක වෙමින් මගී ප්‍රවාහන කාර්යයෙහි ප්‍රබල කාර්යභාරයක් ඉටු කළේය. කෙසේ වෙතත්, පසුගිය වසරේ දායකය වූ සියයට 85 සමග සසඳන විට මෙය අඩු ප්‍රමාණයක් විය. ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් සපයන ලද මූල්‍ය ආධාර මගින්, ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයට (ශ්‍රී.ලං.ම.ග.ම.) අයත් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල (ප්‍රා.ග.ම.) වාහන ඇණිය වැඩි කරන ලදී. මගී සහ භාණ්ඩ ප්‍රවාහනයෙහිලා පෞද්ගලික අංශයෙන් එල්ලවූ තියුණු තරගය හමුවේ, සිය සේවාවන්ගේ කාර්යක්ෂම බව හා ඵලදායී බව වැඩි කිරීමේ තාත්වික ආකල්පයක් අනුගමනය කිරීමට රාජ්‍ය අංශයේ ආයතනවලට සිදු විය. ඒ සම්බන්ධයෙන් ධාවන මාර්ග හා ගමන් වේලාවන් නැවත සකස් කිරීම සහ වාසිදායී නොවන ඇතැම් සේවාවන් නතර කිරීම ආදී ක්‍රමවලින් ප්‍රා.ග.ම. විසින් පියවර කිහිපයක් ගනු ලැබිණි. මෙම ක්‍රියා මාර්ගයන් ගනු ලැබුවේ තෙල් මිළ ඉහළ නැගීම හා එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදුකළ ගාස්තු වැඩි කිරීමත් සමගම වන බැවින්, ඉහළ යන ධාවන පිරිවැය සීමා කිරීමෙහිලා එම පියවරයන්හි සාර්ථක බව නිර්ණය කිරීමට තරම් කල්ගතවී නැත. 1983 වසරේදී රාජ්‍ය අංශය මගින් සැපයූ ගමනාගමන සේවාවන්ගේ අඩු වීමට එක් හේතුවක් වූයේ ජූලි හා අගෝස්තු මාසවලදී ධාවන කටයුතු සීමා කිරීමත්, සමහර සේවාවන්, විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත්වල සේවාවන් අඩු කිරීමත්ය.

1983 වර්ෂයේදී ප්‍රා.ග.ම. වල ධාවන කිලෝ මීටර් ප්‍රමාණයේ අඩුවීමක් වාර්තා වුවද ඒවාට අයත් රථ ඇණිය 1982 දී තිබූ 7,453 ප්‍රමාණයේ සිට 7,686 දක්වා වැඩි කරගෙන තිබිණි. 1983 දී රථ ඇණියට එක් කරනු ලැබූ අළුත් බස් රථ සංඛ්‍යාව 451 ක් වූ අතර පසුගිය වසරේ එම ප්‍රමාණය 559 ක් විය. වර්ෂය තුළදී එක් කළ අළුත් බස් රථවලට අමතරව, ශ්‍රී ලං.ම.ග.ම. ට අයත් වැඩ පොලවල අළුත්වැඩියා කරන ලද බස් රථ 470 ක් එක් කිරීමෙන් ද රථ ඇණිය තවත් ශක්තිමත් කරන ලදී. 1983 වසරේදී වාහන තොගයෙන් ඉවත් කරනු ලැබූ බස් රථ සංඛ්‍යාව 265 ක් වූ අතර 1982 දී එය 313 ක් විය.

ප්‍රා.ග.ම. නවයෙහි ධාවන කිලෝ මීටර් ප්‍රමාණය සහ මගී කිලෝ මීටර් ප්‍රමාණය මේ වසරේදී අඩු විය. වාහන උපයෝගීකරණ මට්ටමේ අඩු වීම මගින් පිළිබිඹු කෙරෙන පරිදි ධාවන කිලෝ මීටර් ප්‍රමාණයේ පහත බැසීමටත් (සියයට 5 ක) වඩා වැඩි ප්‍රමාණයකින් (සියයට 13 කින්) මගී කිලෝ මීටර් ප්‍රමාණය පහත වැටී ඇත. පැටවුම් සාධකය ඉකුත් වසරේ වූ සියයට 64 ක ප්‍රමාණයේ සිට මේ වසරේදී සියයට 59 දක්වා අඩු වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත,

ශ්‍රී.ලං.ම.ග.ම. හි සහ ප්‍රා.ග.ම. නවයෙහි 1983 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල තවමත් පිළියෙල කර අවසන් නැත. එහෙත්, ඉකුත් වසර හා සසඳන විට 1983 දී ධාවන කිලෝ මීටරයකට වැය වූ සේවක වැටුප් සහ ඉන්ධන වියදම් ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 15 කින් සහ සියයට 20 කින් වැඩි වී ඇති බව තාවකාලික සංඛ්‍යාවන් මගින් පෙන්නුම් කෙරිණි. සිය පාඩු පියවා ගැනීම සඳහා රජයේ සහනාධාර මත අඛණ්ඩව මහත්සේ බලාපොරොත්තු තබාගත් ශ්‍රී.ලං.ම.ග.ම. 1983 දී දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 245 ක මුදලක් එසේ ලබාගති. වැඩිවන ඉන්ධන වියදම නිසා ඉහළ ගිය පිරිවැය පියවා ගැනීම සඳහා ශ්‍රී.ලං.ම.ග.ම. සහ ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී.ල.දු.සේ.) මේ වසර තුළදී සිය මිල ව්‍යුහයන් දෙවරක්ම සංශෝධනය කරනු ලැබීය.

**1.25 සංඛ්‍යා සටහන**

**ගමනාගමන අංශයේ මූලික ලක්ෂණ 1982—1983**

| ශිර්ෂය | 1982 | 1981 ට වඩා ප්‍රතිශත වෙනස | 1983 | 1982 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1· නව මෝටර් රථ ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව .. | | | | |
| 1·1 ශ්‍රී.ලං.ම.ග.ම. බස් රථ .. | 555 | 2,212·5(අ) | 521 | – 6·1 |
| 1·2 පෞද්ගලික බස් රථ .. | 2,533 | 8·7 | 3,748 | · 48·0 |
| 1·3 පෞද්ගලික මෝටර් රථ .. | 5,667 | – 1·6 | 5,470 | – 3·5 |
| 1·4 මෝටර් බයිසිකල් .. | 10,847 | – 36·8 | 14,431 | 33·0 |
| 1·5 ලොරි සහ අනෙකුත් බඩු ගෙන යන වාහන .. | 6,459 | – 19·6 | 8,191 | 26·8 |
| 2· ශ්‍රී ලං.ම.ග.ම. ක්‍රියාකාරිත්වය .. | | | | |
| 2·1 ධාවන කිලෝ මීටර් (දශ ලක්ෂ) .. | 481·8 | – 2·4 | 457·4 | – 5·1 |
| 2·2 මගී කිලෝ මීටර් (දශ ලක්ෂ) (ආ) .. | 16.573·2 | 1·0 | 14,460·3* | – 12·7 |
| 2·3 මුළු ආදයම (රුපියල් දශ ලක්ෂ) .. | 1,966·1* | 10·5 | ල.නො. | ල.නො. |
| 2·4 මුළු පිරිවැය (රුපියල් දශ ලක්ෂ) .. | 2,483·7* | 12·5 | ල.නො. | ල.නො. |
| 2·5 පාඩුව (රුපියල් දශ ලක්ෂ) .. | 517·6* | 20·6 | ල.නො. | ල.නො. |
| 3· ශ්‍රී.ලං.දු.සේ. ක්‍රියාකාරිත්වය | | | | |
| 3·1 ධාවන කිලෝ මීටර් (දශ ලක්ෂ) .. | 10·2 | – 3·0 | 8·3* | – 18·6 |
| 3·2 මගී කිලෝ මීටර් (දශ ලක්ෂ) .. | 3,121·3 | 4·6 | 2,443·4* | – 21·7 |
| 3·3 භාණ්ඩ ටොන් කිලෝ මීටර් (දශ ලක්ෂ) .. | 216·8 | – 0·9 | 223·8 | 3·2 |
| 3·4 මුළු ආදයම (රුපියල් දශ ලක්ෂ) .. | 427·4 | 4·5 | 434·7 | 1·7 |
| 3·5 මුළු වියදම (රුපියල් දශ ලක්ෂ) .. | 751·7 | 16·6 | 887·2 | 18·0 |
| 3·6 කාරක පාඩුව (රුපියල් දශ ලක්ෂ) .. | 324·3 | 37·4 | 452·5 | 39·5 |

* තාවකාලිකය

මූලයන් : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව; ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය; ශ්‍රී ලංකා දුම්රිය සේවය.

(අ) මෙම විශාල ප්‍රතිශත වෙනසට හේතුවූයේ 1981 දී අළුතෙන් ලියාපදිංචි කළ බස් රථ සංඛ්‍යාව (24) ඉතාමත් අඩු වීමය.

(ආ) වාර ප්‍රවේශ පත්‍ර දරන්නන්ගේ ගමන් ද ඇතුළත්ය.

පසුගිය වසර හා සසඳන විට 1983 දී ශ්‍රී ලං.දු.සේ. හි ධාවන කිලෝ මීටර් ප්‍රමාණය හා මගී කිලෝ මීටර් ප්‍රමාණය පිළිවෙළින් සියයට 19 කින් හා සියයට 22 කින් සැළකිය යුතු ලෙස පහත වැටිණි. මගී සේවාවන් සඳහා රාජ්‍ය ආයතනවලට තිබූ අනුග්‍රහය අඩුවෙමින් පවතිද්දීත් ශ්‍රී ලං.දු.සේ. එහි භාණ්ඩ ප්‍රවාහන කටයුතු පුළුල් කර ගැනීමට සමත් විය. පසුගිය වසර හා

සසඳන විට, දශ ලක්ෂ 224 ක් වූ භාණ්ඩ ටොන් කිලෝ මීටර් ප්‍රමාණය සියයට 3 ක වැඩිවීමක් පෙන්විය. 1982 වසරේදී දක්නට ලැබුණු සියයට 1 ක සෘණ වර්ධනය හා සසඳන විට මෙය මේ වසරේදී කැපී පෙනුණු හිතකර ලක්ෂණයක් විය. ශ්‍රී ලං.ම.ග.ම. මෙන්ම ශ්‍රී ලං.දු.සේ. ද විමසුමට ලක්වන වසර තුළදී තිබුණු ලෙස මූල්‍ය පාඩු විඳිනු ලැබීය. 1982 දී රුපියල් දශ ලක්ෂ 324 ක් වූ ශ්‍රී.ලං.දු. සේවයේ කාරක පාඩුව මේ වසරේදී සියයට 40 කින් ඉහළ ගොස් රුපියල් දශ ලක්ෂ 453 ක් බවට පත් විය.

අළුතෙන් ලියා පදිංචි කරනු ලැබූ පෞද්ගලික බස් රථ සංඛ්‍යාවෙහි සියයට 48 ක තියුණු වර්ධනයක් වාර්තා කරමින් පෞද්ගලික අංශය සීඝ්‍ර ලෙස පුළුල්වීම මේ වසරේ දක්නට ලැබුණු සැළකිය යුතු ලක්ෂණයක් විය. වසර අවසානය වන විට ධාවනයෙහි යොදා තිබුණු මුළු පෞද්ගලික බස් රථ සංඛ්‍යාව 12,000 ක් ලෙස ද, එයින් නිත්‍ය ධාවනය සඳහා යොදා ගත හැකි වූ සංඛ්‍යාව 10,000 ක් ලෙස ද ඇස්තමේන්තු කළ හැකිය. එහෙත්, මගී සේවාවන් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගෙන ඇත්තේ මෙම මුළු බස් රථ සංඛ්‍යාවෙන් 6,500 ක් පමණකි. පෞද්ගලික බස්රථ සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම, 1983 වසරේදී සිදුවූ සැළකිය යුතු ආයතනික ප්‍රගතියකි. පෞද්ගලික බස් රථ ප්‍රවාහනය ක්‍රමානුකූල කිරීමේ අදහසින් 1983 අංක 44 දරණ පෞද්ගලික බස් සේවා පනත මගින් ව්‍යවස්ථාවන් සම්පාදනය කෙරිණි. පණතේ ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම වෙනුවෙන් රු. 5,000 ක උපරිමයකට යටත්ව දඩ ගැසීම හෝ වසරකට නොවැඩි කාලයකට බන්ධනාගාරගතකිරීම හෝ ඒ දඬුවම් දෙකම ලබා දීම හෝ කළ හැකිය. එසේම මහා මාර්ගවල ආරක්ෂාව සහතික කරනුවස් මාර්ග නීති කඩකිරීම වෙනුවෙන් වන දඬුවම් වැඩි කිරීම කෙරෙහි ද අවධානය යොමුවී ඇත.

1983 වසර අවසානය වන විට පෞද්ගලික ධාවකයින් විසින් රථ වාහන වෙනුවෙන් ආයෝජිත මුළු සමුච්චිත මුදල රුපියල් දශ ලක්ෂ 3,000 ක් විය. වර්ෂය තුළදී පෞද්ගලික මගීවාහනවලින් අය කළ ආනයන තීරු බදු සහ බලපත්‍ර ගාස්තු වශයෙන් රජයට ලැබුණු ආදායම රුපියල් දශ ලක්ෂ 25 ක් වූ අතර 1982 දී එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 17 ක් විය.

**නිවාස සහ නාගරික සංවර්ධනය**

රාජ්‍ය අංශයේ නිවාස වැඩපිළිවෙල යටතේ මෙහෙයවන ලද නිවාස ඉදි කිරීමේ කටයුතු මෙම වර්ෂය තුළදී තවදුරටත් විකරණය කරන ලදී. මෙහි වඩාත්ම වැදගත් ලක්ෂණයක් හැටියට සඳහන් කළ හැක්කේ අධික වියදම් සහිත ඉදි කිරීම් වල සිට අඩු වියදම් සහිත ඉදි කිරීම් කරා විතැන් වීමය. අඩු වියදම් නිවාස ගණයට අයත් වන ග්‍රාමීය නිවාස උප වැඩ පිළිවෙල යටතේ ඉදි කිරීම් කටයුතු තවදුරටත් වේගවත් කෙරිණි. වර්ෂය තුළදී මැතිවරණ කොට්ඨාශබදව නිවාස තැනීමේ උප වැඩ පිළිවෙල යටතේ ඉදි කරන ලද නිවාස ගණනද වැඩි කරන ලදී. වඩාත් අධික වියදම් සහිත සෘජු ඉදි කිරීම් ගණයේ නිවාස ගොඩනැගීම් සංඛ්‍යාව අඩුවී ගිය ආකාරයෙන් රාජ්‍ය අංශයේ නිවාස වැඩ පිළිවෙලෙහි සීමාකිරීමක් සිදුවූ බව පැහැදිලිව දක්නට හැකිය. 1983 දී රජයේ සේවක නිවාස ඉදිකිරීමේ උප වැඩපිළිවෙල නිත්‍ය වශයෙන්ම ඇණ හිටියේය.

1982 දී නිවාස ඒකක 7,598 ක් තනා නිම කර තිබූ අතර නිවාස ඒකක 19,921 ක් ඉදිකෙරෙමින් පැවතිනි. මෙම සංඛ්‍යා සමග සසඳන විට 1983 වර්ෂයේ ඊට අදාළ සංඛ්‍යාවන් පිළිවෙලින් 11,658 ක් සහ 8,091 ක් විය. රාජ්‍ය අංශයේ නිවාස වැඩ පිළිවෙල සඳහා වැය කෙරුණු මුළු පිරිවැය 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 862 සමග සසඳන විට 1983 දී රුපියල් දශ ලක්ෂ 532 ක් විය.

පහතින් දක්වනු ලබන සංඛ්‍යා ලේඛන ආශ්‍රයෙන් 1983 වර්ෂය තුළදී සෘජු ඉදි කිරීම් ස්වරූපයේ උප වැඩපිළිවෙල යටතේ ගොඩනැංවීම්වල වර්ධනය සකස්වූ ආකාරය ගැන අදහසක් ලබා ගත හැකිය. නිම කරන ලද නිවාස ඒකක ගණන 1982 දී වූ 1,810 සමග සසඳන විට 1983 දී 1,312 ක් විය.

## 1·26 සංඛ්‍යා සටහන

### රාජ්‍ය අංශයේ නිවාස යෝජනා ක්‍රමයන්හි ප්‍රගතිය 1982—1983

| යෝජනා ක්‍රමය | ඉලක්ක කර ඇති ඒකක ගණන | ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු. දශ ලක්ෂ) | සම්පූර්ණ කරන ලද ඒකක ගණන | | | ඉදිවෙමින් පවතින ඒකක ගණන | | මුළු වියදම (රු. දශ ලක්ෂ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 1982 | 1983 | 1978 සිට 1983 | 1982 | 1983 | 1982 | 1983* | 1978 සිට 1983 |
| 1· සෘජු ඉදිකිරීම .. | 36,000 | 4,608·8 | 1,810 | 1,312 | 10,986 | 2,713 | 1,523 | 659·5 | 392·0 | 3,189·3 |
| 2· ග්‍රාමීය නිවාස .. | 50,000 | 779·8 | 4,492 | 7,386 | 26,645 | 13,844 | 6,254 | 113·9 | 112·8 | 630·6 |
| 2·1 අත්තම් නිවාස .. | | (100·0) | (2,055) | (4,047) | | (8,833) | (3,519) | | | |
| 2·2 ආදර්ශ ගම්මාන .. | | | (1,894) | (3,204) | | (4,826) | (2,685) | | | |
| 2·3 ධීවර නිවාස .. | | | (543) | (138) | | (185) | (50) | | | |
| 3· මැතිවරණ කොට්ඨාශබද නිවාස .. | 26,040 | 760·0 | 1,140 | 2,960 | 10,310 | 3,340 | 290 | 71·8 | 19·4 | 594·8 |
| 4· රජයේ සේවක නිල නිවාස .. | 695 | 88·0 | 156 | — | 395 | 37 | 24 | 9·0 | 7·5 | 88·2 |
| 5· ජාතික නිවාස අරමුදලේ ණය .. | 14,000 | — | — | — | 28,000 | | | — | — | 275·0 |
| මුළු ගණන .. | 126,735 | 6,236·6 | 7,598 | 11,658 | 76,336 | 19,934 | 8,091 | 854·2 | 531·7 | 4,777·9 |

* තාවකාලික·

මූලය : ජාතික නිවාස සංවර්ධන අධිකාරිය.

වර්ෂය තුළදී ඉදි කෙරෙමින් පැවති නිවාස ඒකක සංඛ්‍යාව 1,523 ක් වූ අතර, 1982 දී එම ගණන 2,713 ක් විය. 1982 වර්ෂයේදී සෘජු ඉදි කිරීම් උප වැඩපිළිවෙලෙහි මුළු වියදම වූ රුපියල් දශ ලක්ෂ 660 සමග සසඳන විට 1983 දී එම ගණන රුපියල් දශ ලක්ෂ 392 ක් විය. 1982 දී මෙන්ම 1983 දීත් රාජ්‍ය අංශයේ නිවාස වැඩ පිළිවෙල වෙත උපයෝජනය කෙරුණු මුළු මුදලින් විශාලතම කොටස (සියයට 74) සෘජු ඉදි කිරීම් වැඩපිළිවෙල වෙනුවෙන් වැය විය. ඇත්ත-වශයෙන්ම එම ව්‍යාපෘතිය සඳහා ගිය වියදම 1978 සිට මේ දක්වා වූ මුළු සමුච්චිත වියදමෙන් සියයට 67 ක් පමණ වෙයි. ඉලක්ක ගත සංඛ්‍යාව සමග සළකා බලන කල්හි සෘජු ඉදි කිරීම් අංශයේ නිවාස ගොඩනැංවීම්වල තවදුරටත් දක්නට ලැබුනේ බලාපොරොත්තු කඩ කරවන සුළු වාර්තාවන්ය. 1978 සිට 1983 දක්වා වෙන් කරන ලද වියදමෙන් සියයට 70 කට ආසන්න මුදලක් ප්‍රයෝජනයට ගනිමින් සම්පූර්ණ කරනු ලැබ ඇත්තේ ඉලක්ක ගත ඒකක ගණනින් සියයට 30 ක් පමණකි. ආනයනික භාණ්ඩ මත දැඩි ලෙස රඳා පැවතීමත් පුළුල් වන හා වේග-යෙන් ඉහළ යන වියදම සහ මුහුණපෑමට සිදුව ඇති අයවැය සීමාවන්ද සළකා බලනවිට මෙම උප වැඩපිළිවෙලෙහි කටයුතු අනිවාර්යයෙන්ම සීමා කිරීමට සිදු විය හැකිය. රාජ්‍ය අංශයේ නිවාස වැඩපිළිවෙල යටතේ ක්‍රියාත්මක කෙරුණු වඩාත් පිරිමැසුම්දායී වූ ඉදි කිරීම් ක්‍රමය වූයේ (අත්තම් නිවාස, ආදර්ශ ගම්මාන, ධීවර නිවාස ආදියෙන් සමන්විත) ග්‍රාමීය නිවාස උප වැඩ-පිළිවෙලයි. 1983 දී මෙම උප වැඩපිළිවෙල යටතේ නිවාස ඒකක 7,386 ක්ද, 1982 දී 4,492 ක්ද සම්පූර්ණයෙන් නිම කර තිබුණි. තවද 1983 දී නිවාස ඒකක 6,254 ක් ඉදි කෙරෙමින් පැවතුණි. 1982 දී වැය කළ මුළු වියදම වූ රුපියල් දශ ලක්ෂ 114 සමග සසඳන විට මෙම වර්ෂයේදී වැය කරන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 113 ක් විය. 1983 දී රාජ්‍ය අංශයේ නිවාස වැඩපිළිවෙල සඳහා භාවිතයට ගැණුනු මූල්‍යමය සම්පත් වලින් සියයට 21 ක් වැය කර තිබුනේ දේශීය අමු-ද්‍රව්‍ය භාවිතා කිරීම මත පදනම් වූ ග්‍රාමීය නිවාස යෝජනා ක්‍රමය වෙනුවෙනි. එය 1978 සිට මේ දක්වා රාජ්‍ය අංශයෙහි නිවාස වැඩ පිළිවෙලෙහි මුළු සමුච්චිත වියදමෙන් සියයට 13 ක් ලෙස ගණන් බලා ඇත. භෞතික ප්‍රගතිය අතින් සහ පිරිවැය පාලනය අතින් ග්‍රාමීය නිවාස යෝජනා ක්‍රමය වඩාත් සාර්ථක වී ඇති අතර වෙන් කරන ලද මුදලින් සියයට 80 ක් වැය කරමින් එහි ඉලක්කගත ඒකක සංඛ්‍යාවෙන් සියයට 53 ක්ම සම්පූර්ණ කරන ලදී.

සෘජු ඉදි කිරීම වෙනුවට අත්තම් නිවාස වැනි ක්‍රම අනුගමනය කරමින් 1983 දී මැතිවරණ කොට්ඨාශබද උප නිවාස වැඩපිළිවෙලෙහි ඇති වූ නව වෙනස්කම් තුළින් එහි පුනර්ජීවනයක් ඇති විය. ඉකුත් වසරේදී සම්පූර්ණ කරන ලද නිවාස ඒකක 1,140 සමග සසඳන විට විමර්-ශනයට ලක් වන කාලය තුළදී නිවාස ඒකක 2,960 ක් සම්පූර්ණ කර තිබිණි. 1983 දි තවත් නිවාස ඒකක 290 ක ඉදි කිරීම් කටයුතු කෙරෙමින් පැවතිණි. මෙම උප යෝජනා ක්‍රමය සඳහා 1982 දී වැය වුනු රුපියල් දශ ලක්ෂ 72 සමග සසඳන විට 1983 දී රුපියල් දශ ලක්ෂ 19 ක් වැය වී තිබුණි. 1983 රාජ්‍ය අංශයේ නිවාස වැඩපිළිවෙල සඳහා වැය වූ මුදලින් සියයට 4 ක් මැතිවරණ කොට්ඨාශබද නිවාස සඳහා යොදගෙන තිබුණි. කෙසේ වෙතත්, රාජ්‍ය අංශයේ නිවාස වැඩපිළිවෙල සඳහා 1978–1983 අතර කාලය තුළදී වැය වූ මුළු සමුච්චිත වියදමෙන් එම වැඩපිළිවෙල සඳහා වූ වැය සියයට 12 ක් පමණ වෙයි. වෙන් කරන ලද වියදමෙන් සියයට 78 ක්ම භාවිතා කරමින්, ඉලක්ක ගත ඒකක සංඛ්‍යාවෙන් සම්පූර්ණ කර තිබුනේ සියයට 40 ක් පමණකි. වර්ෂය අවසානය වන විට රජයේ සේවකයන් සඳහා වූ නිවාස 24 ක ඉදි කිරීම් කට-යුතු කෙරෙමින් පැවතිණි. 1982 දී ඉලක්ක ගත ප්‍රමාණයෙන් සියයට 57 ක් පමණක් සම්පූර්ණ කර තිබියදී ඒ සඳහා වෙන් කල වියදම ඉක්මවා තිබූ බැවින් මෙම උප වැඩපිළිවෙල නතර කිරීමට සිදුවනු ඇත.

සංඛ්‍යා ලේඛන වලින් හෙළිදරව් වන පරිදි බොහෝ අංශවල රාජ්‍ය අංශයේ නිවාස වැඩ-පිළිවෙලෙහි ඉලක්කය අඩු වීමට හේතු වූයේ මූලික වශයෙන්ම පිරිවැය අධික වීම, වියදම් පියවා ගැනීමේ අඩුපාඩුකම් සහ අයවැය දුෂ්කරතාවයන් ආදිය නිසා හට ගැණුනු ද්‍රවශීලතා ප්‍රශ්නයන්ය. මේ හැර නිපුණ කම්කරුවන්ගේ හිඟයද මෙහි ප්‍රගතිය කෙරෙහි අවහිරතා ඇති කරවීය.

ඉදිරි වර්ෂ හය සඳහා ''නිවාස දශ ලක්ෂයේ වැඩපිළිවෙල'' ආරම්භ කිරීම විමර්ශනයට ලක් වන කාලය තුළදී දක්නට ලැබෙන නව සංවර්ධන වැඩ පිළිවෙලකි. ප්‍රාදේශීය මණ්ඩලවල ආදර්ශ ව්‍යාපෘති 249 ක් ආරම්භ කිරීම මගින් මෙහි වැඩ කටයුතු ආරම්භ කරන ලදී. මෙම කාර්යය සඳහා රුපියල් දශ ලක්ෂ 1.5 ක් වෙන් කරන ලද අතර, තවත් රුපියල් දශ ලක්ෂ 200 ක්ද යෝජනා ක්‍රමය සඳහා වෙන් කොට තිබේ.

1983 වර්ෂයෙන් ඇරඹෙන සිව් වසර සඳහා රජයේ ආයෝජන වැඩපිළිවෙලෙහි අනාගත සැළසුම්වලට අනුව රුපියල් දශ ලක්ෂ 5,506 ක ප්‍රමාණයක් නිවාස හා ඉදි කිරීම් සඳහා අවශ්‍ය ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කොට තිබේ. මින් රුපියල් දශ ලක්ෂ 3,208 ක් හුදෙක් නිවාස ඉදි කිරීම සඳහා පමණක්ම වෙන් කොට ඇත.

ආර්ථික සංවර්ධනයට පහසුකම් සැලසෙන අයුරින් නාගරික හා වාණිජ ප්‍රදේශවල ප්‍රති-සංස්කරණ හා සංවර්ධන කටයුතුවල නාගරික සංවර්ධන අධිකාරිය (නා. සං. අ.) නිරත වී සිටියි. නා. සං. අ. හි ව්‍යාපෘති වැඩ කටයුතු පසුගිය වසරෙහිදී කෙරිගෙන ගිය වේගය සලකා බලන කල මෙම වසරෙහිදී එහි ක්‍රියාකාරිත්වය සැළකිය යුතු අන්දමින් පහත වැටුණි. මෙම සාපේක්-ෂක මන්දගාමිත්වයට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ ප්‍රමාණවත් මූල්‍යමය සම්පත් නා. සං.අ. සතුව නොතිබීම සහ ඉහළ යන ඉදි කිරීම් පිරිවැයත්ය. නව ව්‍යාපෘතීන් ආරම්භ කරනවාට වඩා වැඩි අවධානයක්, කෙරිගෙන යන ව්‍යාපෘතීන් සම්පූර්ණ කිරීම සඳහා යොමු විය.

1982 දී සහ 1983 දී නිම කරන ලද කටයුතුවල වටිනාකම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 833 ක් සහ රුපියල් දශ ලක්ෂ 417 ක් විය. ආරම්භයේ සිටම නා. සං. අ. විසින් නිම කරවා ඇති කාර්යයන්හි මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 2,256 කි. 1983 වර්ෂය තුළදී කෙරුණු වැඩ කටයුතුවල වටිනාකමින් අති විශාල ප්‍රමාණයකට දායක වූ බත්තරමුල්ල සහ පැලවත්ත පරිපාලන සංකීර්ණයන් සඳහා වැය කරන ලද මුදල පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 117 ක් සහ රුපියල් දශ ලක්ෂ 62 ක් විය. ආරම්භයේ සිටම මෙම පරිපාලන සංකීර්ණ දෙක සඳහා වැය වී ඇති මුළු මුදල පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 266 ක් සහ රුපියල් දශ ලක්ෂ 298 ක් වෙයි. කර්මාන්ත හා බඩු ගබඩා විතැන් කිරීමේ වැඩපිළිවෙලෙහි එක් අදියරක් වන ඔරුගොඩවත්ත ආහාර ගබඩා සංකීර්ණය සඳහා 1983 දී රුපියල් දශ ලක්ෂ 51 ක් වැය කරන ලදුව මේ සඳහා මෙතෙක් වැය කොට ඇති මුළු මුදල රුපියල් දශ ලක්ෂ 170 ක් බවට පත් විය. එළවළු වෙළෙඳ-පල සහ කච්චේරිය පාර ව්‍යාපෘතිය සඳහා 1983 දී රුපියල් දශ ලක්ෂ 26 ක් වැය වූ අතර එහි මුළු සමුච්චිත වියදම රුපියල් දශ ලක්ෂ 81 ක් විය. නා. සං. අ. විසින් මෙහෙයවනු ලැබූ විශාල ව්‍යාපෘතියක් වූ ශාන්ත ජෝන් මාළු වෙළඳසැල ප්‍රතිසංස්කරණ කටයුතු 1983 දී නිමාවට පත් විය. මෙම ව්‍යාපෘතිය සඳහා වූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 297 ක් වූ අතර එයින් රුපියල් දශ ලක්ෂ 18 ක්ම 1983 දී වැය කරන ලදී. නා. සං. අ. විසින් මෙහෙයවනු ලැබූ විශාලතම ව්‍යාපෘතිය වූ පාර්ලිමේන්තු සංකීර්ණයේ නිමැයුම් කටයුතුද අවසන් විය. මෙම ව්‍යාපෘතිය සඳහා මුළු සමුච්චිත වියදම රුපියල් දශ ලක්ෂ 924 ක් වූ අතර එයින් රුපියල් දශ ලක්ෂ 23 ක්ම 1983 වර්ෂයේදී වැය කරන ලදී.

සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය අන්තර් ජාතික තත්ත්වයට ගෙන ඒම පිණිස කරන ලද ප්‍රතිසංස්කරණ කටයුතුද 1983 දී අවසන් විය. පැලියගොඩ හා රත්මලාන කාර්මික බඩු ගබඩා ඉදි කිරීම් කටයුතුද කෙරෙමින් පැවතිණි. ''කලම්බු ලැන්ඩ් ඇන්ඩ් ඩිවලප්මන්ට් කම්පනි'' සමග එක්ව ඉදි කරන ලද ලිබර්ටි සංකීර්ණයේ වැඩ කටයුතුද අවසන් වෙමින් පැවතිණි.

නා. සං. අ. යටතට ගැනෙන කටයුතු අතර ඉතා වැදගත් ව්‍යාපෘතියක් වන මුඩුක්කු හා පැල්පත් නගා සිටුවීමේ වැඩපිළිවෙල සඳහා විමර්ශනයට ලක් වන වර්ෂය තුළදී වැය කරන ලද මුදල රුපියල් දශ ලක්ෂ 9 ක් වූ අතර වර්ෂය අවසානය වන විට මෙම වැඩපිළිවෙල සඳහා වැය වූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 25 ක් විය. ඉඩම් බැංකුව පිහිටුවීම 1983 දී ඇති වූ නව සංවර්ධනයකි. මෙම බැංකුවේ පරමාර්ථය නම් සංවර්ධන කටයුතු සඳහා යෝග්‍ය වන පුද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම සහ රජයේ ඉඩම්වල බදු හිමිකම් තබා ගැනීමයි. මෙම කාර්යය සඳහා 1983 අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 34 ක් වැය කරන ලදුව එහි මුළු වියදම රුපියල් දශ ලක්ෂ 72 ක් බවට පත් විය.

නා. සං. අ. හි ප්‍රධාන අරමුදල් මූලාශ්‍රයන් වූයේ ණයකර මුදල්, ප්‍රතිපාදන වියදම් සහ අධිකාරිය විසින්ම උපයා ගනු ලබන ආදයම් ආදියයි. ඉකුත් වර්ෂයන්හිදී මෙන්ම 1983 දීත් එහි අරමුදල් සංයුතියෙහි ණයකර දයකත්වය ඉතා විශාල වූ අතර මෙම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 300ක් පමණ විය. කුලී සහ බදු මුදල් ආශ්‍රිතව අභ්‍යන්තරිකව උපයා ගන්නා ලද මුදල රුපියල් දශ ලක්ෂ 100 දක්වා ඉහළ නැගි අතර, 1983 දී භාණ්ඩාගාරය වෙතින් ලැබුණු මුදල රුපියල් දශ ලක්ෂ 30 ක් විය. අනාගතයේදී වාණිජමය පදනමක් මත කටයුතු කරමින් මෙම ව්‍යාපෘතීන් සඳහා අරමුදල් ලබා ගැනීම කෙරෙහි නා. සං. අ. හි අවධානය යොමු වනු ඇත.

පෞද්ගලික අංශයේ නිවාස ගොඩ නැංවීම හා ඉදි කිරීම් කටයුතු පිළිබඳව දීප ව්‍යාප්ත සංඛ්‍යා නොමැතිකම නිසා මෙම අංශයේ ප්‍රගතිය මැනීම සඳහා දර්ශකයන් දෙකක් භාවිතා කරනු ලැබේ. එනම්, කොළඹ මහ නගර සභාව විසින් අනුමත කරනු ලබන ගොඩනැගිලි සැලසුම් සහ නිවාස ඉදි කිරීම් සඳහා වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයනු ලබන ණය මුදල්ය. 1982 වර්ෂය සමග සැසඳීමේදී මෙම වර්ෂයේදී කොළඹ මහ නගර සභාව විසින් අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැළසුම් සංඛ්‍යාව පහත් මට්ටමක පැවතුණි. 1982 දී 1,245ක් වූ නිවාස සැළසුම් අනුමත කිරීම් 1983 දී සියයට 21 ක අඩු වීමක් පෙන්නුම් කරමින් එම සංඛ්‍යාව 986 ක් විය. මෙම සංඛ්‍යාවන්ගෙන් හෙළි වන කරුණක් වන්නේ කොළඹ මහ නගර සීමාව තුළ පවත්නා ඉඩම් හිඟතාවය සහ ඒවායේ අධික මිළ ගණන් හේතුකොටගෙන විශේෂයෙන්ම කාර්මික හා වාණිජ ගොඩනැගිලි උප නාගරික ප්‍රදේශ කරා විතැන්වී ගිය බවය. ගොඩනැගිලි ද්‍රව්‍ය මිළ, ශ්‍රම වැටුප්, මුදල් පොළී ආදිය ඉතා ඉහළ මට්ටමක පැවතීම පෞද්ගලික අංශයේ නිවාස හා ඉදිකිරීම් කටයුතු අඩපණ කිරීමට ඉවහල් විය.

### 1 . 27 සංඛ්‍යා සටහන

**කොළඹ මහ නගර සභාව විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම්* 1982—1983**

| ශීර්ෂය | | 1982 | 1981 ට වඩා ප්‍රතිශත වෙනස | 1983 | 1982 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| 1· නව නේවාසික ගොඩනැගිලි | .. | 589 | 11·1 | 532 | – 9·7 |
| 1·1 නිවාස | .. | 364 | 26·4 | 347 | – 4·7 |
| 1·2 තට්ටු නිවාස | .. | 225 | – 7·0 | 185 | – 17·8 |
| 2· වාණිජ ගොඩනැගිලි | .. | 45 | –22·4 | 4 | – 91·1 |
| 3· නව කර්මාන්ත ගොඩනැගිලි | .. | 10 | 150·0 | — | – 100·0 |
| 4· නව පාසැල් ගොඩනැගිලි | .. | 3 | –40·0 | — | – 100·0 |
| 5· එකතු කිරීම් හා වෙනස් කිරීම් | .. | 538 | 1·9 | 411 | – 23·6 |
| 6· වෙනත් ගොඩනැගිලි | .. | 60 | 300·0 | 39 | – 35·0 |
| මුළු ගණන | | 1,245 | 9·2 | 986 | – 20·8 |

මූලය : කොළඹ මහ නගර සභාව.

* රජයේ සහ සංස්ථාවල ගොඩනැගිලි සැළසුම් හැර

නිවාස ඉදිකිරීම සඳහා වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයනු ලැබ ඉදිරියේදී පියවීමට ඇති මුළු ශේෂය සියයට 30 කින් වැඩි විය. මෙසේ ගෙවිය යුතු ණය මුදල් 1982 දී රුපියල් දශ ලක්ෂ 1,500 ක්ද, 1983 දී රුපියල් දශ ලක්ෂ 1,945 ක්ද විය. කෙසේ වෙතත්, වියදම් ඉහළ යාමට අනුව ගලපන්නේ නම් ණය මුදල් වැඩි වීම සැළකිය යුතු එකක් ලෙස නොපෙනේ.

ප්‍රධාන වශයෙන්ම නිවාස සඳහා අරමුදල් සැපයීමෙහි නියැලී සිටින එකම මූල්‍ය ආයතනය වන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පෞද්ගලික නිවාස තැනීම දිරි ගැන්වීම පිණිස 1983 දී තම කටයුතු ව්‍යාප්ත කරන ලදී. ණය ලබා ගන්නවුන් හට ප්‍රයෝජනවත් ලෙස 1983 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි පොළී අනුපාත පහත දමන ලද අතර ණය ලබා දීමේ ක්‍රමය යලි සැළකිල්ලට භාජනය කරන ලදී. මීට අමතරව, ණය මුදල්වල උපරිම සීමාව වැඩි කරන ලද අතර ණය ලබා ගන්නවුන් ධෛර්‍යමත් කරවනු පිණිස ආපසු අය කර ගැනීමේ ක්‍රියා පිළිවෙල සංශෝධනය කරන ලදී. ගොඩනැගිලි ඉදි කරන්නවුන් සහ ඉදි කිරීම් කටයුතුවල නියැලෙන්නවුන්හට ප්‍රයෝජනවත් නව ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. සියයට 7 සිට සියයට 24 දක්වා වූ විවිධ පොළී අනුපාත යටතේ මුළු ගණන රුපියල් දශ ලක්ෂ 151 ක් වූ ණය ලබා දීම් 1,412 කට 1983 දී අනුමතිය ලබා දෙන ලදී.

ගොඩනැගිලි සමිතියක් ලෙස නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව (නි. සං. මූ. ස.) 1954 අංක 37 දරණ ජාතික නිවාස පණත යටතේ 1983 දෙසැම්බර් මාසයේදී සංස්ථාපනය කරන ලදී. රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය ඒකාබද්ධව මෙම ආයතනය පවත්වාගෙන යනු ලැබේ.

1983 ජූලි මස දිවයිනේ හටගත් කැළඹිලි වලින් පසුව එම වසරේ අගෝස්තු මස 07 වැනි දින මහජන ආරක්ෂක ආඥා පනතේ (40 වැනි පරිච්ඡේදය) හදිසි රෙගුලාසි යටතේ (අ) හානියට පත් දේපල ප්‍රතිසංස්කරණය කිරීම හා අළුත්වැඩියා කිරීම (ආ) විනාශයට පත් කර්මාන්ත හා ව්‍යාපෘති පුනරුත්ථාපනය කිරීම සඳහා දේපල හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ (වි. දේ. ක.) අධිකාරිය පිහිටුවන ලදී. 1983 අවසානය වන විට මෙම ආයතනය විසින් රාජ්‍ය ආයෝජන උකස් බැංකුව (රා. ආ. උ. බැ.) හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව මාර්ගයෙන් ලබා ගත හැකි වන ලෙස පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 8.4 ක් හා රුපියල් දශ ලක්ෂ 1 ක් වටිනා ණය අයදුම්පත් 85 ක් සහ පරිත්‍යාග 46 ක් අනුමත කරන ලදී. රා. ආ. උ. බැ. විසින් සියයට 2, සියයට 4 සහ සියයට 6 යන ණය අනුපාත යටතේ රුපියල් දශ ලක්ෂ 6.8 ක් වටිනා ණය මුදල් 68 ක් අනුමත කරන ලදී. සියයට 9 පොළී අනුපාතය යටතේ ණය මුදල් 17 ක් ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් අනුමත කරන ලදී. මෙම බැංකු දෙක මගින් වාණිජ ආයතනවලට ණය ලබා දීම සඳහා පහසුකම් නොමැති බැවින් ණය ලබා දී ඇත්තේ වාසය සඳහා වන ගොඩනැගිලි ප්‍රකෘතිමත් කිරීම සඳහා පමණකි. කෙසේ වෙතත්, වාණිජ ව්‍යාපාරවලට ණය මුදල් නිර්දේශ කිරීමට විදේක අධිකාරියට හැකි වන ලෙස ලංකා බැංකුව විසින් කුඩා සහ මධ්‍යම පරිමාණයේ වාණිජ ආයතනවල ප්‍රයෝජනය සඳහා යෝජනා ක්‍රමයක් සකස් කොට ඇත.

### කඩිනම් මහවැලි වැඩපිළිවෙල

රටේ ප්‍රධානතම සංවර්ධන යෝජනා ක්‍රමයන්ගෙන් එකක් වන කඩිනම් මහවැලි වැඩපිළිවෙල 1983 වර්ෂය තුළදී සැළකිය යුතු ප්‍රගතියක් ලබාගෙන ඇත. 1983 අවසානය වන විට මෙම යෝජනා ක්‍රමය වෙනුවෙන් දරා ඇති මුළු වියදම රුපියල් දශ ලක්ෂ 18,414 ක්වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 7,130 ක් හෙවත් සියයට 39 ක් වැය කරන ලද්දේ 1983 වර්ෂය තුළදීය.

කඩිනම් මහවැලි වැඩපිළිවෙල ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. වික්ටෝරියා, කොත්මලේ, මාදුරු ඔය සහ රන්දෙනිගල යන ප්‍රධාන ජලාශ යෝජනා ක්‍රම හතර, පහළ වාරිමාර්ග සහ ඉංජිනේරු කටයුතු සහ ගොවි පවුල් පදිංචි කිරීම හා කෘෂි නිෂ්පාදන කටයුතු ඒ ප්‍රධාන කොටස් තුනවේ.

වික්ටෝරියා යෝජනා ක්‍රමය සඳහා අරමුදල් ලැබෙන එකම ඉතා වැදගත් මූලාශ්‍රය නම් එක්සත් රාජධානියෙන් ලැබෙන දීමනාවය. 1983 වර්ෂය අවසානය දක්වා මෙම යෝජනා ක්‍රමය වෙනුවෙන් කර ඇති වියදම රුපියල් දශ ලක්ෂ 5,107 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 1,839 ක් හෙවත් සියයට 36 ක් 1983 වර්ෂය තුළදී වියදම් කරන ලදී. 1984 අප්‍රේල් මාසය වනවිට වික්ටෝරියා ජලාශයේ ජලය පිරවීම ආරම්භ වීමට නියමිතයි. වේල්ල ඉදිකිරීමේ කටයුතු වලත්, වික්ටෝරියා යෝජනා ක්‍රමය අවට ප්‍රදේශය තුළ පාරවල් සහ පාලම් තැනීම සම්බන්ධ කටයුතුවලත් සැහෙන දියුණුවක් පෙන්නුම් කෙරුණි. ප්‍රධාන වැඩ කටයුතු අවසන් වීමත් සමගම, වික්ටෝරියා යෝජනා ක්‍රමය රටෙහි ජල විදුලි බලය නිපදවීමේ ධාරිතාව මෙගවොට්ස් 210 කින් හෙවත් දැනට පවතින ධාරිතාවයෙන් සියයට 52 කින් වැඩි කරනු ඇත.

කොත්මලේ යෝජනා ක්‍රමය සඳහා ස්විට්සර්ලන්ත ජාත්‍යන්තර සංවර්ධන ආයතනය මගින් අරමුදල් සැපයෙන අතර, එහි වැඩ කටයුතු 1985 වන විට අවසාන වීමට නියමිතය. මෙම යෝජනා ක්‍රමය මහවැලි ගඟේ අතු ගංගාවක් වන කොත්මලේ ඔය හරහා ඉදි කෙරෙන වේල්ලකින් සහ භූගත ජල විදුලි බලාගාරයට පිවිසෙන උමං ක්‍රමයකින්ද සමන්විත වේ. 1983 වර්ෂය අවසාන වන විට මෙම යෝජනා ක්‍රමය සඳහා කරන ලද මුළු වියදම රුපියල් දශ ලක්ෂ 4,742 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 2,054 හෙවත් සියයට 43 ක් 1983 වර්ෂය තුළදී වියදම් කරන ලදී. අඩු පීඩන උමඟ තැනීම් කටයුතු සහ ප්‍රධාන උමං දෙකෙහි සිවිල් ඉංජිනේරු කටයුතු, යෝජනා ක්‍රමයට සම්බන්ධ පාරවල් සහ උමං, වර්ෂය තුළදී අවසන් කරන ලදී. ප්‍රධාන වේල්ල සම්බන්ධ තැනීම් කටයුතු අවසාන වෙමින් පවතින අතර , එහි ජලය පිරවීමේ කටයුතු 1984 නොවැම්බර් මස සිදුකිරීමට නියමිතය.

ජර්මන් ෆෙඩරල් ජනරජයේ මූල්‍ය ආධාර ලබන රන්දෙනිගල යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු 1982 දී ආරම්භ කරන ලද අතර, 1986 මැද භාගය වන විට අවසන් කිරීමට නියමිතය. මෙම යෝජනා ක්‍රමය සම්බන්ධ තැනීම් කටයුතුවල සතුටුදායක ප්‍රගතියක් 1983 වර්ෂය තුළදී දක්නට ලැබුණි. මෙම යෝජනා ක්‍රමය වෙනුවෙන් 1983 වර්ෂය අවසාන වන විට කර තිබූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 1,045 ක් වූ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 891 හෙවත් සියයට 85 ක් 1983 වර්ෂය තුළදී වියදම් කරන ලදී. 'සී' සහ 'බී' කලාපයට වාරිමාර්ග ජලය ගෙනයනු ලබන මිනිපේ ඇල සංකීර්ණයේ තැනීම් කටයුතු නිම වෙමින් පවතී.

**1 . 28 සංඛ්‍යා සටහන**

**කඩිනම් මහවැලි වැඩපිළිවෙල — ගණන් බලනලද වියදම්**

(රුපියල් දශ ලක්ෂ)

| යෝජනා ක්‍රමය | 1983 සඳහා වෙන්කළ වියදම | | | 1983 නියම වියදම (අ) | 1983 අවසන් වනවිට සමුච්චිත වියදම (අ) |
|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | පරිපූරක | එකතුව | | |
| 1. වික්ටෝරියා ජලාශය .. | 1,645 | — | 1,645 | 1,839 | 5,107 |
| 2. කොත්මලේ ජලාශය .. | 2,404 | — | 2,404 | 2,054 | 4,742 |
| 3. රන්දෙනිගල ජලාශය .. | 665 | — | 665 | 891 | 1,045 |
| 4. මාදුරුඔය ජලාශය .. | 355 | — | 355 | 345 | 2,507 |
| 5. මිනිපේ ඇල සංකීර්ණය .. | 137 | — | 137 | 298 | 920 |
| 6. 'බී' වාරිමාර්ග කලාපය .. | 749 | — | 749 | 753 | 1,258 |
| 7. 'සී' වාරිමාර්ග කලාපය .. | 383 | — | 383 | 523 | 1,217 |
| 8. I වන සහ II වන අදියර .. | 240 | — | 240 | 293 | 1,343 |
| 9. අනෙකුත් .. | 216 | — | 216 | 134 | 275 |
| එකතුව .. | 6,794 | — | 6,794 | 7,130 (ආ) | 18,414 |

(අ) තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

(ආ) 1982 වර්ෂය සඳහා වෙන්කළ මුදලින් වියදම් නොකොට ඉතිරිවූ මුදල් 1983 වර්ෂය තුළදී වියදම් කිරීම හේතුකොටගෙන 1983 අයවැයෙන් වෙන් කරන ලද මුදලට වඩා නියම වියදම් ප්‍රමාණය වැඩිය.

කැනඩා රජයේ මූල්‍ය ආධාර ලබන මාදුරුඔය යෝජනා ක්‍රමය මූලික වශයෙන්ම වාරිමාර්ග පහසුකම් සැපයීම හා ගොවි පවුල් පදිංචි කිරීම සම්බන්ධ යෝජනා ක්‍රමයකි. අතිරේක වශයෙන් මහවැලි ජලය එක්රැස් කෙරෙන මෙම ජලාශය මගින් හෙක්ටයාර 37,500 කට වාරිමාර්ග පහසුකම් සැපයෙනු ඇත. 1983 වර්ෂය අවසාන වන විට මේ සඳහා වියදම් කරන ලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 2,507 ක් වන අතර එයින් රුපියල් දශ ලක්ෂ 345 ක් (සියයට 14 ක්) 1983 වර්ෂය තුළදී වියදම් කරන ලදී. මාදුරුඔය වේල්ලේ තැනීම් කටයුතු සම්පූර්ණ කරන ලද අතර, ජලය රැස්කිරීම ආරම්භ කරන ලදී. ප්‍රධාන වම් ඉවුරේ ඉදිකිරීම් කටයුතු 1983 මැද භාගයේදී ආරම්භ කරන ලද අතර, නාගොල ඇල, දී ඇල සහ කඩිඋන්න ඇල වේල්ල සහ දකුණු ඇල ඉවුරේ පිටවාන ගේට්ටුවල වැඩ නිමවීමට ආසන්නව පවතී. දකුණු ඉවුරේ පහල බිම් ප්‍රදේශ සංවර්ධනය කිරීමේ වැඩ සම්බන්ධ තැනීම් කටයුතු තවමත් ආරම්භ කර නැත. උල්හිටිය ජලාශයෙන් 'සී' කලාපයේ දෙවන කොටසට වාරිමාර්ග පහසුකම් සැලසීම සඳහා ජලය නිකුත් කිරීම ආරම්භ කළ අතර, රත්කිඳ ඔය ජලාශයේ තැනීම් කටයුතු 1983 දී සම්පූර්ණ කරන ලදී.

**1 . 29 සංඛ්‍යා සටහන**

**මහවැලි වැඩ පිළිවෙල යටතේ වගා කළ අළුත් ඉඩම් ප්‍රමාණය**
**('එච්' ප්‍රදේශය)**

හෙක්ටයාර

| ශීර්ෂය | 1980/81 මහ | 1981 යල | 1981 එකතුව | 1981/82 මහ | 1982 යල | 1982 එකතුව | 1982/83 මහ | 1983* යල | 1983* එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| වගා කළ බිම් ප්‍රමාණය .. | 20,663 | 9,444 | 30,106 | 22,568 | 6,875 | 29,443 | 27,680 | 8,290 | 36,470 |
| (අ) වී .. | 20,663 | 6,923 | 27,586 | 20,680 | 2,522 | 23,202 | 27,534 | 5,596 | 33,130 |
| (ආ) අනෙකුත් භෝග .. | — | 2,521 | 2,521 | 1,888 | 4,353 | 6,241 | 146 | 3,194 | 3,340 |

* තාවකාලිකයි

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මහවැලි සංවර්ධන වැඩ පිළිවෙලට අයත් වන ප්‍රදේශයේ, 1983 වර්ෂය තුළදී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 51,220 ක් විය. එයින් හෙක්ටයාර 46,000 ක වී වගා කළ අතර, හෙක්ටයාර 5,220 ක අනෙකුත් භෝග වගා කරන ලදී. 1983 දී බොහෝ දුරට ඉඩම් සංවර්ධන සහ ගොවි පවුල් පදිංචි කරවීමේ කටයුතු නිමවී ඇති 'එච්' කලාපයේ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් වී හෙක්ටයාර 33,130 කට ද, අනෙකුත් භෝග හෙක්ටයාර 3,340 කටද වගකියනු ලැබීය. 'සී' කලාපයේ තවත් වී හෙක්ටයාර 4,970 ක්ද, වෙනත් භෝග හෙක්ටයාර 770 ක් ද, වගා කරනු ලැබීය. 'බී' සහ 'ජී' කලාපයන්හි වී වගා කරන ලද බිම් ප්‍රමාණය පිළිවෙලින් හෙක්ටයාර 3,940 ක් සහ 3,960 ක් විය.

'එච්' කලාපයේ වී වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 43 කින් වැඩිවූ නමුත් පසුගිය වර්ෂය සමග සසඳන විට නිෂ්පාදනය දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වැඩි විය. කෙසේ වුවද, 1983 යල කන්නයේදී කලා වැව ජලාශයෙන් සැපයූ ජලය ප්‍රමාණවත් නොවූ නිසා අනෙකුත් භෝග වගා කරන ලද බිම් ප්‍රමාණය සියයට 46 කින් සැලකිය යුතු පරිදි අඩු විය. 1983 යල කන්නයේදී ''එච් 5'' ප්‍රදේශයේ වගාව සම්පූර්ණයෙන් පාහේ ගෙවතු වගාවට සීමා විය.

1983 දෙසැම්බර් වන විට 'එච්' කලාපයේ පදිංචි කරවන ලද මුළු පවුල් සංඛ්‍යාව 23,262 ක් වූ අතර, ඉන් පවුල් 698 ක් හෙවත් සියයට 3 ක් 1983 වර්ෂය තුළදී පදිංචි කරවනු ලැබීය. 1983 අවසාන වන විට 'සී' කලාපයේ පදිංචි කරවන ලද මුළු පවුල් සංඛ්‍යාව 7,444 ක් වූ අතර, ඉන් පවුල් 1,988 ක් 1983 වර්ෂය තුළදී පදිංචි කරවන ලදී. 1983 අවසානය වන විට 'බී' කලාපය පවුල් 4,262 ක් පදිංචි කරවා තිබූ අතර, ඉන් පවුල් 1,412 ක් 1983 වසර තුළදී පදිංචි කරවනු ලැබීය.

1983 දී 'ජී' ප්‍රදේශයේ පදිංචි කරවන ලද මුළු පවුල් සංඛ්‍යාව 240 ක් විය. ඒ අනුව 1983 අවසානයේදී කඩිනම් මහවැලි වැඩ පිළිවෙල යටතේ පදිංචි කරවා තිබූ මුළු පවුල් සංඛ්‍යාව 33,408 ක් විය.

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙලේ ප්‍රධාන අරමුණ වනුයේ දැනට මහා පරිමාණ ආයෝජන වැඩපිළිවෙලයන්ගෙන් ප්‍රතිලාභ නොලබන දිස්ත්‍රික්කයන්හි ඵලදායිතාවය, ආදායම්, සේවා නියුක්තිය සහ ජනතාවගේ ජීවිතයේ ගුණාත්මක මට්ටම දියුණු කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ වඩා තුලනාත්මක ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීමයි. එම නිසා මෙම වැඩපිළිවෙල සංවර්ධන ක්‍රියාවලියේ පසුපසින් සිටින සාපේක්ෂව අඩු දියුණු දිස්ත්‍රික්කයන් කෙරෙහි යොමු වී ඇත. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල ප්‍රාදේශීය අවශ්‍යතාවයන් සපුරාලීම උදෙසා ඉහළ පූර්වතාවකින් යුත් කෙටි සහ මැදිකාලීන වැඩපිළිවෙලයන් දියුණු කිරීමට අදහස් කරයි. මෙම ප්‍රාදේශීය අවශ්‍යතාවයනට, සංවර්ධනය සහ ජනතාවගේ ජීවිතයේ ගුණාත්මක තත්ත්වය කෙරෙහි කිට්ටු බලපෑමක් ඇති කරනු ලබන ආයතන වැඩි දියුණු කිරීමද අයත් වේ.

පළමුවන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල 1979 වර්ෂයේදී ලෝක බැංකුවේ මූල්‍ය ආධාර ඇතිව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරනු ලැබීය. එතැන් පටන් තවත් දිස්ත්‍රික්ක කීපයක් විවිධ ජාත්‍යන්තර මූලාශ්‍රයන්ගෙන් ලැබුණ අරමුදල් වලින් මෙම වැඩපිළිවෙල යටතට ගනු ලැබ ඇත. 1983 අවසානය වන විට ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල දිස්ත්‍රික්ක 7 ක ක්‍රියාත්මක වෙමින් පැවති අතර, ඉදිරි වර්ෂ 2 ක තුළදී තවත් දිස්ත්‍රික්ක 5 ක් මෙම වැඩපිළිවෙලට ඇතුළත් කිරීම උදෙසා සැළසුම් සකස් කරමින් තිබිණි.[1]

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල, ඒවායේ සැළසුම් කල වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙලයන්ද අඩංගු පැහැදිලිව හඳුනාගත් ව්‍යාපෘති මාලාවක් මත පදනම් වේ. එනිසා මෙය තරමක් දැඩි සැළසුම් ආකෘතියක් ලෙසද සළකනු ලැබේ. මෙයට හේතුව නම් කලින් හඳුනාගත් සහ එකහත්වයට පැමිණි ව්‍යාපෘති මාලාවෙන් ඇත්වන ප්‍රධාන වෙනස්කම් කිරීමට මේ යටතේ ඉඩක් නොමැති වීමය. මාතලේ, පුත්තලම සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි වැඩපිළිවෙලයන් උදෙසාද මෙය සත්‍ය වේ. හම්බන්තොට වැඩ පිළිවෙල මීට වඩා බෙහෙවින් නම්‍ය වන්නේ ආධාර දෙනු ලබන ආයතනය සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව පූර්වතාවන් සහ ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාවද අනුව අළුත් උප ව්‍යාපෘතීන් ඇතුළත් කිරීමට ඒ යටතේ ඉඩ ඇති හෙයිනි. මාතර සහ නුවරඑළිය වැඩපිළිවෙලයන් වාර්ෂික පදනමක් මත ක්‍රියාත්මක කරනු ලබන අතර, සම්පූර්ණ වැඩපිළිවෙල උදෙසා ආධාර දෙනු ලබන ආයතනයන් සමග ගිවිසුම්වලට එළැඹීම මේ යටතේ සිදු නොකෙරේ. ඒ අනුව අවශ්‍ය වෙතොත් වෙනස්කම් කිරීම උදෙසා මේ යටතේ බෙහෙවින් ඉඩකඩ ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල පළමුවෙන් පස් අවුරුදු යෝජනා ක්‍රම කාලයක් උදෙසා රුපියල් දශ ලක්ෂ 465 ක මුළු පිරිවැයක් සහිතව සැළසුම් කරන ලදී. මෙම පිරිවැයෙන් සියයට 43 ක් ලෝක බැංකුව විසින් ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් සපයනු ලැබේ. 1983 අවසානය වනවිට යෝජනා ක්‍රමය සඳහා මුළු පිරිවැය රුපියල් දශ ලක්ෂ 360 ක් හෙවත් ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැයෙන් සියයට 77 ක් වූ අතර, 1983 වර්ෂයේදී පමණක් වියදම රුපියල් දශ ලක්ෂ 72 ක් විය. කුරුණෑගල ප්‍රමුඛස්ථානය ගත් යෝජනා ක්‍රම අතරට වාරිමාර්ග පහසුකම් සහ විදුලිබල පහසුකම් වැඩි දියුණු කිරීම සහ පොල් වගා සංවර්ධනය ද අයත් වේ. 1983 අවසානය වන විට ප්‍රධාන වැව් තුනක් ද, කුඩා වැව් 252 ක් ද ප්‍රතිසංස්කරණය කිරීම අවසන් කොට තිබූ අතර, ග්‍රාමීය විදුලි බල යෝජනා ක්‍රම 16 ක වැඩද අවසන් වී තිබුණි.

1. මෙම දිස්ත්‍රික්ක පහෙන් මන්නාරම සහ වව්නියාව යන දිස්ත්‍රික්කයන්හි වැඩපිළිවෙලයන් ක්‍රියාත්මක කිරීම 1984 දී, ආරම්භවීමට නියමිතය.

## 1.30 සංඛ්‍යා සටහන
## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල—දිස්ත්‍රික්ක අනුව වියදම (1982—1983)

(රුපියල් දශ ලක්ෂ)

| දිස්ත්‍රික්කය (අ) | ගණන් බලන ලද වියදම | | | සමුච්චිත වියදම | | 1982 වර්ෂය තුළදී වියදම | 1983* වර්ෂය තුළදී වියදම |
|---|---|---|---|---|---|---|---|
| | විදේශීය | දේශිය | එකතුව | 1982 වර්ෂය අවසානය දක්වා | 1983* වර්ෂය අවසානය දක්වා | | |
| 1. කුරුණෑගල (1979) | 197·7 | 267·3 | 465·0 | 287·9 | 359·9 | 59·7 | 72·0 |
| 2. මාතර (1979) | 85·7 | — | 85·7 | 67·7 | 74·4 | 14·6 | 6·7 |
| 3. හම්බන්තොට (1979) | 260·0 | — | 260·0 | 117·6 | 157·6 | 36·2 | 40·0 |
| 4. නුවරඑළිය (1980) | — | — | — | 44·7 | 76·8 | 18·1 | 26·1 |
| 5. මාතලේ (ආ) (1981) | | | } 736·0 | 104·0 | 145·0 | 76·4 | 41·0 |
| 6. පුත්තලම (ආ) (1981) | | | | 124·8 | 185·5 | 87·9 | 60·7 |
| 7. බදුල්ල (1982) | 148·5 | 257·0 | 405·5 | 2·0 | 24·8 | 2·0 | 22·8 |

* තාවකාලිකයි. මූලය : සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය.

(අ) ක්‍රියාත්මක කරන ලද වර්ෂය වරහන් තුලින් දක්වේ.

(ආ) ලෝක බැංකුව විසින් මාතලේ සහ පුත්තලම දිස්ත්‍රික්ක දෙකම එක ව්‍යාපෘතියක් ලෙස ඒකාබද්ධ කොට ඇති හෙයින් එකී දිස්ත්‍රික්ක සඳහා විදේශීය හා දේශීය වියදමේ සංයුතිය ඒකාබද්ධව ගණනය කර ඇත.

මාතර සහ හම්බන්තොට ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙලයන් පස් අවුරුදු ඇස්තමේන්තු කරනු ලැබූ යෝජනා ක්‍රම කාලයක් සහිතව 1979 දි ආරම්භ කරනු ලැබිය. මාතර දිස්ත්‍රික්කයේ වැඩපිළිවෙල සඳහා ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනය අරමුදල් සපයන අතර, හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැඩපිළිවෙල සඳහා අරමුදල් සපයන්නේ සංවර්ධනය සඳහා නෝර්වීජියානු ආධාර දීමේ වැඩපිළිවෙල (නොරාඩ්) යටතේය. 1983 අවසානය වන විට මාතර දිස්ත්‍රික්කයේ වැඩපිළිවෙල සම්බන්ධයෙන් මුළු වියදම රුපියල් දශ ලක්ෂ 74 ක් වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 7 ක් 1983 වර්ෂය තුළදී වැය විය. 1983 වර්ෂය අවසානය වනවිට හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැඩපිළිවෙල වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 158 ක් වැය කොට තිබූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 40 ක් 1983 වර්ෂය තුළදී වැය විය.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල 1980 දී ආරම්භ කරනු ලැබූ අතර, 1983 අවසානය වනවිට ඒ වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 71 ක් වැය කොට තිබුණි. ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 26 ක් 1983 වර්ෂය තුළදී පමණක් වැය විය. මෙම වැඩපිළිවෙල අනිකුත් දේවල් අතර, දිස්ත්‍රික්කයේ ජනගහණයේ වැඩි කොටසක ජීවිතයේ ගුණාත්මක තත්ත්වය කෙරෙහි ඍජු බලපෑමක් ඇති කරනු ලබන ඉහළ පූර්වතාවක් ඇති ආයෝජන ලෙස සැළකෙන සෞඛ්‍ය පහසුකම් සහ බීමට සුදුසු ජලය ලබා ගැනීමට ඇති පහසුකම් වැඩිදියුණු කිරීම අවධාරණය කරනු ලබයි.

මාතලේ සහ පුත්තලම් දිස්ත්‍රික්කයන්හි ඒකාබද්ධ සංවර්ධන වැඩපිළිවෙලයන් ලෝක බැංකුවේ මූල්‍ය ආධාර ඇතිව 1981 දී ආරම්භ කරනු ලැබිය. මාතලේ දිස්ත්‍රික්කයේ වැඩපිළිවෙල, අනෙකුත් දේවල් අතර , සුළු අපනයන භෝග සංවර්ධනය සහ නැවත වන වගා කිරීම උදෙසා වැඩි අවධානයක් යොමු කරන අතර, පුත්තලම් දිස්ත්‍රික්කයේ වැඩපිළිවෙල වාරිමාර්ග, මංමාවත් සංවර්ධනය සහ පොල් වගාව පිළිබඳ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි. මාතලේ වැඩපිළිවෙල වෙනුවෙන් වියදම් 1983 වර්ෂය අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 145 ක් වූ අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 41 ක් 1983 වර්ෂය තුළදී වැය කරන ලදී. පුත්තලම් දිස්ත්‍රික්කයේ වැඩපිළිවෙල සම්බන්ධයෙන් 1983 වර්ෂය අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 186 ක් වියදම් කොට තිබූ අතර, 1983 වර්ෂය තුළදී වියදම රුපියල් දශ ලක්ෂ 61 ක් විය.

බදුල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම 1982 ජූලි මාසයේදී ආරම්භ විය. මීට අරමුදල් සපයන්නේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල සහ ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනය යන මූලාශ්‍ර දෙක මගිනි. මෙම වැඩපිළිවෙලයන්හි අපේක්ෂිත යෝජනා ක්‍රම කාලච්ඡේදය වන අවුරුදු පහ සඳහා ඇස්තමේන්තු කරන ලද පිරිවැය රුපියල් දශ ලක්ෂ 406 ක් වේ. මේ වැඩපිළිවෙල යටතේ කුඩා තේ ඉඩම් සංවර්ධනය, සෞඛ්‍ය සහ අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු කිරීමට ද ඉහළ ප්‍රමුඛතාවයක් දෙනු ලැබ ඇත. මීන් 1984–86 කාලච්ඡේදය තුළදී පසුව සඳහන් කල කාර්යයන් දෙක උදෙසා වන මුළු වියදම ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනයෙන් ලැබෙන දීමනාවක් මගින් දරනු ඇත.

**සේවා නියුක්තිය**

1983 වර්ෂයේදී රාජ්‍ය සහ රාජ්‍ය අනුබද්ධිත යන අංශ දෙකෙහිම සේවා නියුක්තිය වැඩිවිය. සේවක අර්ථසාධක අරමුදල් දත්තයන් මත පදනම් වී ඇති පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ අවසාන ඇස්තමේන්තු මේ දක්වා ලැබී නොමැත. සංවිධානය නොවූ පෞද්ගලික අංශයේ සහ විදේශ ආයෝජන පදනම් කර ගත් පෞද්ගලික අංශයේ ව්‍යවසායයන්හි සේවා නියුක්තිය වැඩි වී ඇති බව පෙනේ.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 1983 දී 4,670 කින් වැඩිවී ඇත. සේවා නියුක්තියේ සියයට 1 ක්වූ මෙම ආන්තික වැඩිවීම සිදුවූයේ රජයේ වියදම් අඩුකිරීමේ තීරණයක් පවා තිබියදීය.

රාජ්‍යඅනුබද්ධිත අංශයේ සේවා නියුක්තිය වැඩිවූයේ සියයට 0.2 කින් පමණකි. මෙය 1982 වසරේ වර්ධනයට වඩා මඳක් අඩුය. 1982 වර්ෂයේ වැඩිවීම සියයට 0.5 ක් විය. ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය ( ශ්‍රී.ලං. ග. ම.) සහ ධීවර සංස්ථාව වැනි සමහර රාජ්‍ය අනුබද්ධ ආයතන ක්‍රියාත්මක වියදම් කපාහැරීමේ අදහසින් ගෙන යන සේවක සංඛ්‍යාව අඩුකිරීමේ ප්‍රතිපත්ති මෙයට හේතු විය. සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරී ගිණුම් මත පදනම් වූ සංවිධානය වූ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ 1983 වසරේ අවසාන ඇස්තමේන්තු මේ වනතුරු ලැබී නොමැත. කෙසේ වෙතත් නියත සංඛ්‍යාලේඛන ඇති මේ හා සම්බන්ධ විදේශීය ආයෝජන අංශයෙහි සේවා නියුක්තියේ වැඩිවීමක් පෙන්නුම් කරයි. 1983 දී මහ කොළඹ ආර්ථික කොමිසමෙහි (ම. කො. ආ. කො.) සේවා නියුක්ති 3,779 කින් වර්ධනය විය. තවද වසරේ මුල් භාගය තුළදී විදේශ ආයෝජන උපදේශක කමිටුව (වි. ආ. උ. ක.) මගින් අනුමත කරන ලද ව්‍යාපෘතීන්හි ඇති කරනු ලැබූ නව රැකියා ගණන 4,865 ක් විය. මෙසේ 1977 සිට 1983 දක්වා කාලය තුළ ඇති කරන ලද මුළු රැකියා ගණන 26,944 කි.

පුද්ගලික අංශයේ සෑහෙන ප්‍රමාණයක් ඇතුළත්, සංවිධානය නොවූ කාර්යයන් වන සම්ප්‍රදයික කෘෂිකර්මය, ඉදිකිරීම් සහ ස්වයං රැකියා වැනි දේ පිළිබඳ සංඛ්‍යා තොරතුරු ලබා ගැනීමට නොමැත. කෙසේ වෙතත් විමසීමට භාජනය කරනු ලබන වර්ෂය තුළදී මෙම අංශයන්හි සිදුවී ඇති ආර්ථික වර්ධනය අනුව සේවා නියුක්ති වර්ධනයක්ද සිදුවී ඇතැයි යන අදහස සනාථ කිරීමට ප්‍රමාණවත් කරුණු ඇත.

බොහෝවිට සේවා නියුක්තියේ මෙබඳු වර්ධනයක් සිදුවීමට ඉඩ ඇත්තේ වී වගාව, පතල් සහ කැණීම්, වෙළඳ සහ පෞද්ගලික ප්‍රවාහනය යනාදී අංශයන්හිය. වී වගාව යටතට පත් අක්කර ප්‍රමාණය සියයට 7 කින් වර්ධනය වී ඇති අතර එම අංශයේ සියයට 14 ක වර්ධනයක් සිදුවී ඇත.

ගමනා ගමන, පතල් සහ කැණීම් සහ වෙළඳ අංශ පිළිවෙලින් සියයට 5, 8 සහ 5 වර්ධනයක් වාර්තා කරයි. 1.31 සංඛ්‍යා සටහනෙහි දක්වෙන අයුරු 1978 සිට සේවා නියුක්තියෙහි කැපී පෙනෙන වැඩිවීම් සිදුවී ඇත. මේ වර්ධනයේ වැඩි කොටසක් පෞද්ගලික අංශයේ වන අතර,